වලපනේ ප්‍රාදේශීය සභාව
නුවරඑළිය දිස්ත්‍රික්කය
----------------------------------------

1. මූල්‍ය ප්‍රකාශන
-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
-----------------------------------

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 අප්‍රේල් 06 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 ජූලි 31 දින සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
--------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට වලපනේ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
------------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
-------------------------

(අ) සමාලෝචිත වර්ෂයේ මුද්දර ගාස්තු ආදායම රු.4,771,310 ක් වුවද මූල්‍ය ප්‍රකාශනවල රු.3,513,710 ක් ලෙස ගිණුම්ගතකර තිබූ බැවින් රු.1,257,600 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී නිම නොකල කර්මාන්ත 03 කට හා ආරම්භ නොකල එක් කර්මාන්තයකට අදාළව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන වල රු.2,500,000 ක ණයහිමි ප්‍රතිපාදන සැලසීම නිසා කර්මාන්ත ණයහිමියෝ සහ ප්‍රාග්ධන වියදම එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) මහජන පුස්තකාලය සඳහා පළාත් පාලන දෙපාර්තමේන්තුව මගින් වර්ෂය තුළ ලබාදී තිබුණු රු.27,085 ක් වූ පුස්තකාල පොත්වල වටිනාකම මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර නොතිබීම නිසා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පුස්තකාල පොත් වටිනාකම සහ ප්‍රාග්ධන යෙදුමට ආදායමෙන් දායකවීමේ ගිණුම රු.27,085 බැගින් අඩුවෙන් දැක්වේ.

(ඈ) 2016 වර්ෂයේදී රු.20,094 ක විවිධ තැන්පතු ආපසු ගෙවීමේදී එම මුදල විවිධ තැන්පතු ගිණුම හර නොකර ණයහිමි ගිණුම හර කිරීම නිවැරදි කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේ විවිධ ණය හිමියෝ රු.20,094 කින් හරකර විවිධ තැන්පතු ගිණුම එම වටිනාකමින් බැරකර තිබුණි. මේ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ

දෙසැම්බර් 31 දිනට විවිධ ණය හිමියන් රු.40,188 ක් අඩුවෙන් හා විවිධ තැන්පතු එම වටිනාකමින් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල රු. 537,887 ක් වටිනා කොම්පෝස්ට් බඳුන් 190 ක් ඇතුළත් කර තිබුණද, එම කොම්පෝස්ට් බඳුන් 2016 වර්ෂයේදී නිකුත් කළ ඒවා වූ බැවින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අතැති තොග සහ සමුච්චිත අරමුදල එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේදී නිමකරන ලද කර්මාන්තවල වැඩ වටිනාකම රු.31,811,275 ක් වුවද එම වටිනාකම රු.26,640,482 ක් ලෙසට රු.5,170,793 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු බැවින් ප්‍රාග්ධන වියදම සහ ණයහිමියන් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දැක්වේ.

(උ) සමාලෝචිත වර්ෂයේ නිමකරන ලද කර්මාන්ත වෙනුවෙන් ලැබියයුතු මුදල රු.31,811,275ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවල එම වටිනාකම රු.34,215,589 ක් ලෙසට රු.2,404,314 ක් වැඩියෙන් දක්වා තිබුණු බැවින් ණය ගැතියන් සහ වසරේ ආදායම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දැක්වේ.

(ඌ) සමාලෝචිත වර්ෂයේදී නිමකරන ලද කඳපොල හයිෆොරස්ට් වත්ත කෝවිල අසල මාර්ගය හා පාලම් සංවර්ධනය සඳහා ගෙවිය යුතු මුදල රු.373,000 ක් වුවද, එම වටිනාකම රු.37,500ක් ලෙසට රු.335,500 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(එ) උඩපුස්සැල්ලාව ඇනික්වත්ත මාර්ගයේ කුඩා පාලම ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා සමාලෝචිත වර්ෂය අවසානයට ගෙවිය යුතු මුදල රු.50,000 ක් වුවද, ව්‍යාපෘතියේ මුළු වටිනාකම වූ රු.500,000 ම ණයහිමියන් යටතේ ගිණුම්ගතකිරීම නිසා රු.450,000 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඒ) "වෙනත් - ලිඩස් ඩේල්" වත්ත මාර්ගය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය සඳහා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු මුදල රු.47,850 ක් වුවද, එම වටිනාකම රු.430,631ක් ලෙසට රු.382,781 ක් වැඩියෙන්ද, ගෙවිය යුතු මුදල රු.47,850 ක් වුවද එම වටිනාකම රු.430,631 ක් ලෙසට රු.382,781 ක් වැඩියෙන්ද මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඔ) සමාලෝචිත වර්ෂයේදී නිමකර තිබුණු හයිෆොරස්ට් අංක 3 කොටස වතු මාර්ගය ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු මුදල රු.48,925 ක් වුවද, එම මුදල රු.489,320 ක් ලෙසට රු.440,395 ක් වැඩියෙන් දක්වා තිබුණි. එමෙන්ම එම ව්‍යාපෘතිය සඳහා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු මුදල රු.48,925 ක් වුවද එම මුදල ණය හිමියන් යටතේ දක්වා නොතිබුණි.

(ඕ) සමාලෝචිත වර්ෂයේදී නිමකරන ලද වෙනත් කර්මාන්ත 08 ක් සඳහා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු හා ගෙවිය යුතු මුදල රු.3,740,879 ක් වුවද එම වටිනාකම රු.3,621,286 ක් ලෙසට රු.119,593 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

1.3.2. නොසැසඳුණු ගිණුම්

------------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ 04 ක ගිණුම් අනුව ශේෂ සහ උපයෝගී ලේඛන අනුව ශේෂ අතර, රු.974,755 ක වෙනසක් නිරීක්ෂණය විය.

1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

-------------------------------------

1.3.3.1 ලැබිය යුතු ගිණුම්

---------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ 02 ක එකතුව රු.24,306,643 ක් වූ අතර ඉන් රු.1,400,589 ක් වසරක කාලයක් ඉක්මවා අයනොකර පැවතුණි.

1.3.3.2 ගෙවිය යුතු ගිණුම්

---------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂ 03 ක එකතුව රු.33,759,022 ක් වූ අතර, ඉන් රු.8,066,011 ක් වසරක කාලයක් ඉක්මවා ගෙවා නොතිබුණි.

1.3.4 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

----------------------------------------------------------

අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.26,569,100 ක් වූ ගිණුම් විෂයයන් 09ක් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

1.3.5 අනුකූල නොවීම

-------------------

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

----------------------------------------------------------------------------

ප්‍රාදේශීය සභාවේ සේවය කර ස්ථාන මාරුවීම ලබාගිය, විශ්‍රාම ගිය, සේවය හැර ගිය සහ මියගිය නිලධාරීන්/ සේවකයින් 18 දෙනෙකුගෙන් 2015 වර්ෂයට පෙර සිට අයවිය යුතු රු.149,297 ක ණය මුදල් ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4 වන වගන්තිය ප්‍රකාරව කටයුතුකර අයකර ගෙන නොතිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.6,929,981 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.10,762,074 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම් , රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත්කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ. කෙසේ වුවද එම තොරතුරු එකිනෙක සැසඳීමේදී නොසැසඳීම් පවතින බවද නිරීක්ෂණය විය.

| | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i).වරිපනම් හා බදු | 2,312,974 | 2,449,170 | 1,851,807 | 1,517,888 | 2,275,419 | 2,433,274 | 1,828,321 | 1,918,106 |
| (ii).කුලී | 6,128,000 | 4,617,855 | 3,976,260 | 3,142,146 | 1,660,000 | 2,555,585 | 2,163,617 | 3,294,550 |
| (iii).බලපත්‍ර ගාස්තු | 3,404,000 | 3,588,348 | 3,588,348 | - | 2,130,000 | 3,162,777 | 3,162,777 | - |
| (iv).වෙනත් ආදායම් | 6,491,000 | 7,306,295 | 4,659,530 | 3,549,712 | 7,669,000 | 12,153,915 | 7,021,272 | 5,132,643 |

2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය

(අ) ප්‍රාදේශීය සභාව සතු කඩ කාමර 05 ක් බදුගත් බදුකරුවන් විසින් මාස 05 සිට මාස 62 දක්වා කාල පරාසයක සිට කුලී ගෙවීම් පැහැර හැර තිබුණු අතර, එම හිඟ කුලී මුදල රු.560,660 ක් විය.

(ආ) සමාලෝචිත වර්ෂයට අදාළ රු.50,000 ක කඩකුලී 2018 අප්‍රේල් 05 දින වන විටද අයකර නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය
------------------------------

3.1 කාර්යසාධනය
------------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කාර්තවයන් ඉටුකිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ). ක්‍රියාත්මක නොකළ ව්‍යාපෘති
----------------------------------

2017 වර්ෂය තුළදී ග්‍රාමීය මාර්ග කි.මී 1000 ක් සංවර්ධනය කිරීම සඳහා වූ වැඩසටහන යටතේ පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශ විසින් ප්‍රතිපාදන සලසා තිබුණු රු.985,420 ක වටිනාකමැති සංවර්ධන ව්‍යාපාති 03 ක් සහ වතු මාර්ග සංවර්ධන වැඩසටහන යටතේ ප්‍රතිපාදන සලසා තිබුණු රු.500,000 ක් වටිනා ව්‍යාපෘතියක් සමාලෝචිත වර්ෂයේදී ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ). තිරසර සංවර්ධන ඉලක්ක
------------------------------

තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක පිළිබඳව ප්‍රාදේශීය සභාව දැනුවත් වී නොතිබුණු අතර, ඒ සම්බන්ධයෙන් කිසිදු කාර්යයක් සමාලෝචිත වර්ෂය තුළ කර නොතිබුණි.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා
-------------------------------------

(අ) 2000 අංක 53 සහ 1988 අංක 56 දරන පනත් වලින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත සහ ඒ යටතේ බලපවත්වන ලද රෙගුලාසිවලට අනුකූලව නිකුත් කර ඇති 2008 ජනවාරි 25 දිනැති අංක 1523/16 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය අනුව පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබාගෙන තිබුණු ව්‍යාපාර 20 ක බලපත්‍රවල වලංගු කාලය අවසන්වී තිබුණද නව බලපත්‍ර නිකුත් කර නොතිබුණි.

(ආ) ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාල බලප්‍රදේශයේ කුලී පදනම මත ධාවනයේ යෙදෙන ත්‍රීරෝද රථවලින් 2017 ජනවාරි 01 දින සිට මාසිකව රු.150 ක ගාස්තුවක් අයකරන බව 2016 නොවැම්බර් මස 11 දිනැති අංක 1993 දරන ගැසට් නිවේදනය මගින් ප්‍රකාශයට පත්කර තිබුණද ඒ අනුව කටයුතුකර නොතිබුණි.

(ඇ) මධ්‍යම පළාතේ පළාත් පාලන කොමසාරිස්ගේ 2016 මාර්තු 17 දිනැති අංක මප/ප.පා.කො/2016/3 දරන චක්‍රලේඛය අනුව කඩ කාමර සඳහා තක්සේරු කරන ලද මාසික කුලිය වසර 05 කට වරක්වත් සංශෝධනය කළයුතු වුවද, කඩ කාමර 19ක් සම්බන්ධයෙන් කුලී සංශෝධනය කර නොතිබුණි.

3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

-------------------------------

පළාත් පාලන කොමසාරිස්ගේ 1988 මැයි 17 දිනැති අංක 1988/22 දරන චක්‍රලේඛය අනුව වරිපනම් බදු සඳහා දේපළ තක්සේරුව වසර 05 කට වරක්වත් කළ යුතු වුවද සභා බලප්‍රදේශයේ වරිපනම් දේපළ 2011 වර්ෂයට පසු තක්සේරු කර නොතිබුණි.

3.4 වත්කම් කළමනාකරණය

-----------------------------

3.4.1 නඩත්තු හා අලුත්වැඩියා සිදුනොකිරීම

------------------------------------------

(අ) නිල්දණ්ඩාහින්න උපකාර්යාලයේ විදුලි සැපයුම වසරක පමණ කාලයක සිට විසන්ධි කර තිබුණු අතර, 2018 මැයි 11 දිනය වන විටද විදුලි සැපයුම සන්ධි කරගෙන නොතිබුණි.

(ආ) නිල්දණ්ඩාහින්න මහජන පුස්තකාලයේ විදුලි සැපයුම වසරක පමණ කාලයක සිට විසන්ධි කර තිබුණු අතර, 2018 මැයි 11 දිනය වන විටද විදුලි සැපයුම සන්ධි කරගෙන නොතිබුණි.

(ඇ) නිල්දණ්ඩාහින්න මහජන පුස්තකාලය දිගුකාලයකින් අලුත්වැඩියා කර නොතිබුණු අතර, වැසි ජලය පුස්තකාලය තුළට කාන්දු වීම නිසා පුස්තකාලයේ සිවිලිම අබලන්වී තිබුණු අතර වැසි ජලය හේතුවෙන් පුස්තකාලයේ කියවීම් මේසයට සහ පුටුවලට හානි සිදුවී තිබුණි.

3.4.2 පවරා නොගත් වත්කම්

---------------------------

ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලය පවත්වාගෙන යන ගොඩනැගිල්ල සහ එය පිහිටි ඉඩමෙහි අයිතිය නිරවුල්කර ගෙන සභාවට පවරාගෙන නොතිබුණි.

4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

------------------------------------------

4.1 අයවැය පාලනය

--------------------

සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනය අනුව ඇස්තමේන්තුගත ආදායම් හා වියදම්, තථ්‍ය ආදායම් හා වියදම් සමග සැසඳීමේදී ආදායම් විෂයයන් 05 ක සියයට 15 සිට සියයට 42 දක්වාද, වියදම් විෂයයන් 07 ක සියයට 17 සිට සියයට 211 දක්වාද විචලනයන් නිරීක්ෂණය වූ බැවින් අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් වශයෙන් යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

4.2 විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම

-----------------------------------------------------------

සමාලෝචිත වර්ෂයේදී විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් එකක් පමණක් පවත්වා තිබුණි.

5. පද්ධති හා පාලන

--------------------

විගණනයේදී නිරීක්ෂණ වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමුකර ඇති අතර, පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| පද්ධතිය | අඩුපාඩුව |
| --- | --- |
| ආදායම් | හිඟ ආදායම් අයකර නොගැනීම |
| ණයගැති/ ණයහිමි | පැරණි ශේෂ නිරවුල් නොකිරීම |
| වත්කම් | නඩත්තු හෝ අලුත්වැඩියා කටයුතු නොකිරීම |
| තොග | තොග ලේඛන යාවත්කාලීන නොකිරීම |